කවරෙකුගේ හදවත තුළ අණුවක තරම් අහංකාරය ඇත්තේ ද ඔහු ස්වර්ගයට නොපිවිසෙනු ඇත.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “කවරෙකුගේ හදවත තුළ අණුවක තරම් අහංකාරය ඇත්තේ ද ඔහු ස්වර්ගයට නොපිවිසෙනු ඇත.” එවිට මිනිසකු: “පුද්ගලයෙක් තම ඇදුම අලංකාරව හා තම පාවහන් අලංකාරව තබා ගැනීමට ප්රිය කරයි. යැයි පැවසීය. එතුමාණෝ: සැබැවින්ම අල්ලාහ් අලංකාරය. ඔහු අලංකාරය ප්රිය කරයි. අහංකාරය යනු සත්යය ගැන උදම් අනමින් ජනයා පාගා දැමීමය.” [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “කවරෙකුගේ හදවත තුළ අණුවක තරම් අහංකාරය ඇත්තේ ද ඔහු ස්වර්ගයට නොපිවිසෙනු ඇත.” මෙම හදීසය අවවාදාත්මක හදීස් අතරින් එකකි. ආගමික සාධක සහිතව විස්තර කිරීමට අවශ්ය වන්නකි. ඒ අනුව කවර හදවතක අහංකාරය ඇත්තේ ද සත්යය ගැන වූ උදම් ඇනීමක් හෝ සත්යය පිළිකුල් කිරීමකින් හෝ විය හැක. එවැන්නා ස්වර්ගයට නොපිවිසෙන, අපා ගින්නට සදාතනිකයකු බවට පත් කරන දේව ප්රතික්ෂේපකයකු වන්නේය. උත්තරීතර අල්ලාහ් ඒ ගැන මෙසේ ප්රකාශ කරයි: “එය ඔවුන් අල්ලාහ් පහළ කළ දෑ පිළිකුල් කළ බැවිණි. එබැවින් ඔවුන්ගේ ක්රියාවන් නිෂ්ඵල විය.” එසේ නැතහොත් මැවීමක් මත පිහිටන අහංකාරයකින් හෝ මැවීමක් මත පිහිටන ගරුබුහුමන් කිරීමකින් විය හැක. නමුත් ඔහු අල්ලාහ්ට නැමදුම් කිරීමට අහංකාර නොවෙයි. මෙම අවවාදය එවැන්නෙකු විෂයයෙහි පැමිණ ඇත. එබැවින් ආරම්භ සලකුණත් ලෙස ඔහු ස්වර්ගයට නොපිවිසෙනු ඇත. යැයි පවසා ඇත. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා මෙම හදීසය සඳහන් කළ කල්හි මිනිසෙකු: අල්ලාහ්ගේ දූතයාණනි! “පුද්ගලයෙක් තම ඇදුම අලංකාරව හා තම පාවහන් අලංකාරව තබා ගැනීමට ප්රිය කරයි. එයත් අහංකාරකමින් වූ ක්රියාවක්දැ?යි විමසීය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්: “සැබැවින්ම අල්ලාහ් අලංකාරය. ඔහු අලංකාරය ප්රිය කරයි.” යැයි පැවසීය. එනම් ඔහුගේ පැවැත්මෙහි ඔහු අලංකාරය. ඔහුගේ ක්රියාවන්හි ඔහු අලංකාරය. ඔහු විසින් මතුවන ඔහුගේ සියලු ගුණාංගයන්හි අලංකාරය. එහෙයින් එය ද අලංකාරයකි. එය පිළිකුල් කරනු ලබන්නක් නොවේ. “ඔහු අලංකාරය ප්රිය කරයි.” එනම් මිනිසා තම ඇඳුම, තම පාවහන්, තම ශරීරය හා තමන්ගේ සියලුම කටයුතු අලංකාරව පිහිටීම ප්රිය කරයි. සැබැවින්ම අලංකරණය යනු මිනිසා වෙත හදවත නැඹුරු කරවන්නක් වේ. මිනිසා වෙත ප්රිය කරවන්නක් වේ. එය තම හිසකෙස්, තම ඇඳුම් පැළඳුම් වලදී මිනිසා පිළිකුල් කරන අභාග්යවන්තකමට විරුද්ධ වූවකි.

http://www.sunnah.global/hadeeth/si/show/6209